ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**Communications Department**

30, Janadhipathi Mawatha, Colombo 01, Sri Lanka.

Tel: 2477424, 2477423, 2477311

Fax: 2346257, 2477739

E-mail: dcommunications@cbsl.lk, communications@cbsl.lk

Web: www.cbsl.gov.lk

# Press Release

| | |
|---|---|
| **Issued By** | බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව |
| **Date** | 30 ඔක්තෝබර් 2020 |

## ඉන්දියාවේ ඇක්සිස් බැංකුවේ ඉල්ලීම පරිදි ඇක්සිස් බැංකුව (ඇක්සිස් බැංකුව කොළඹ ශාඛාව) වෙත නිකුත් කරන ලද බලපත්‍රය අවලංගු කිරීම

ඉන්දියාවේ ඇක්සිස් බැංකුව විසින් 2019 වසරේදී එම **බැංකුවේ** ගෝලීය මෙහෙයුම් පිළිබඳව ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණය මත කරන ලද ඉල්ලීම සලකා බලා ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් 1988 අංක 30 දරණ බැංකු පනතේ විධිවිධාන ප්‍රකාරව, ඇක්සිස් බැංකුව කොළඹ ශාඛාවේ ශ්‍රී ලංකාවේ ව්‍යාපාර කටයුතු වසා දැමීමට සහ එම බැංකුව සඳහා නිකුත් කර ඇති බලපත්‍රය අවලංගු කිරීමට නියමයන් හා කොන්දේසි කිහිපයකට යටත්ව අනුමැතිය ලබා දී තිබේ.

ඇක්සිස් බැංකුව මුදල් මණ්ඩලය විසින් පනවන ලද නියමයන් හා කොන්දේසි වලට අනුකූල වීම පිළිබඳව බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂක සෑහීමකට පත්වීමෙන් පසු, බැංකු කටයුතු කරගෙන යාම සඳහා ඇක්සිස් බැංකුව වෙත නිකුත් කරන ලද බලපත්‍රය 2020 ඔක්තෝබර් 30 දින සිට අවලංගු කරන ලදී.